centre for poverty analysis

**ශ්‍රී ලංකාවේ තරුණ දේශපාලන  පිළිබඳ සංවාද ක්‍රියාකාරිත්වය පිළිබඳ සංවාද මාලාව**

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් ලංකාවේ තරුණ දේශපාලන හා සමාජ ක්‍රියාකාරීත්වය  පිළිබඳව මෑතකදී අධ්‍යයන කිහිපයක් සිදු කළ අතර එහිදී ප්‍රධාන වශයෙන් අනාවරණය වූ කරුණක් නම්  ලංකාවේ වත්මන් තරුණ ප්‍රජාව මෙරට තුළ සිදුවූ තරුණ මැදිහත්වීම් හා ඒවායේ  බලපෑම පිළිබඳව එතරම් සවිඥානික නොවන බවයි. එමෙන්ම සමකාලීන දේශපාලන සන්දර්භය පිළිබඳව ද ඔවුන්ගේ දැනුම හා අවබෝධය වඩාත් පුළුල් විය යුතු බව අපට අවබෝධ විය. තරුණ පිරිස් අතර වාර්ගික හා ආගමික අන්තවාදී නැඹුරුව වර්ධනය වෙමින් පවතින අතර සමාජ මාධ්‍ය තුළ ඔවුන්ගේ භාවිතාව නිසා සමාජය තුළ බෙදීම් තවදුරටත් වර්ධනය වන බවක් දක්නට ලැබේ.

තරුණ ප්‍රජාවට දේශපාලන ප්‍රවණතා හා මැදිහත්වීම්  විචාරාත්මකව අවබෝධ කරගැනීමට අවශ්‍ය  දැනුම සමාජගත කරමින් සමාජ සංවාදයක් ඇතිකිරීම කාලීන අවශ්‍යතාවයකි. එහිලා මූලික පියවරක් ලෙස මෙරට සමාජ දේශපාලන කතිකාවට සුවිශේෂී  බලපෑමක් සිදු කරන ශාස්ත්‍රඥයන් හා තරුණ සමාජ ක්‍රියාකාරිකයන්ගේ දැනුම හා අත්දැකීම් තරුණ ප්‍රජාව සමග හුවමාරු කරගැනීමට සංවාද මාලාවක් සංවිධානය කර තිබේ. මෙම සංවාද මාලාවෙන්  උත්සාහ කරන්නේ ලංකාවේ සමාජ දේශපාලන අවකාශය තුළ සිදුවූ තරුණ මැදිහත්වීම් පිළිබඳව විචාරාත්මකව විමසා බැලීමට තරුණ ප්‍රජාවට අවශ්‍ය මැදිහත්වීම සිදු කිරීමයි. එමෙන්ම සමකාලින දේශපාලනය තුළ තරුණ ක්‍රියාකාරිත්වයේ ප්‍රවණතා පිළිබඳව අධ්‍යයනය කිරීමද මෙම වැඩසටහනේ අරමුණකි.

**න්‍යාය පත්‍රය**

| | | |
|---|---|---|
| දෙසැම්බර් 10 | රමිඳු පෙරේරා | සමකාලින ලංකේය දේශපාලනය සහ තාරුණ්‍යය |
| දෙසැම්බර් 12 | වරදාස් ත්‍යාගරාජා | පීඩිත ප්‍රජාවගේ දේශපාලන මැදිහත්වීම් |
| දෙසැම්බර් 14 | නිර්මාල් රන්ජිත් දේවසිරි | ශ්‍රී ලංකාවේ දේශපාලන අරගලවල තරුණ මැදිහත්වීම |
| දෙසැම්බර් 15 | මහේෂ් හපුගොඩ | මෑතකාලීන තරුණ දේශපාලන ව්‍යාපාර හා බුද්ධිමය මැදිහත්වීම් |
| දෙසැම්බර් 15 | වංගීස සුමනසේකර | සමකාලීන තාරුණ්‍යයේ දේශපාලන සාක්ෂරතාවය හා දැනුම |
| දෙසැම්බර් 16 | කෞෂල්‍යා ආරියරත්න | දේශපාලනයේ ස්ත්‍රියගේ භූමිකාව |
| දෙසැම්බර් 17 | බූපති නලින් වික්‍රමගේ | සෞන්දර්යේ දේශපාලනය |

අදාළ දිනවල සවස **4**ට පමණ zoom ඔස්සේ පැවැත්වෙන අතර  දෙසැම්බර් 15 වංගීස සුමනසේකරගේ වැඩසටහන සවස 7ට පැවැත්වේ. https://www.facebook.com/CepaSL මගින් සම්බන්ධ විය හැකිය

**රමිඳු පෙරේරා** - ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ කථිකාචාර්යවරයෙකි. කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය සහ ස්වීඩනයේ ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් අන්තර්ජාතික මානව හිමිකම් නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය හිමිකරගෙන ඇත. අන්තර්ජාතික මානව හිමිකම් නීතිය, කම්කරු නිතිය හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට උනන්දුවක් දක්වයි.

**නිර්මාල් රන්ජිත් දේවසිරි** - කොළඹ විශ්ව විද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ මහාචාර්යවරයෙකි. නෙදර්ලන්තයේ ලයිඩන් විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය හිමිකරගෙන ඇත. ශ්‍රී ලංකාවේ යටත්විජිත සමාජ පරිවර්තනයන්, පශ්චාත් යටත්විජිත රාජ්‍ය ස්ථාපනය හා රැඩිකල් දේශපාලන ව්‍යාපාර පිළිබඳ පර්යේෂණ සිදු කරයි. දේශපාලන ක්‍රියාධරයෙක් හා සමාජ හා සංස්කෘතික ප්‍රවණතා පිලිබඳ අදහස් දක්වන්නෙක් වන අතර ග්‍රන්ථ කිහිපයක්ම පළ කර ඇත.

**මහේෂ් හපුගොඩ** -සබරගමුව විශ්ව විද්‍යාලයේ භාෂා අධ්‍යනය අංශයේ ඉංග්‍රීසි භාෂාව පිලිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.භාෂාව, සාහිත්‍යය අධ්‍යයනයේ සිට යුරෝපීය හා නූතන දර්ශනය පිළිබඳව පර්යේෂණාත්මක මැදිහත්වීම් සිදු කරයි. ග්‍රන්ථ කිහිපයක්ම රචනා කර තිබෙන අතර චිත්‍රපට හා සංස්කෘතික විචාර පළ කරයි. රොක් සංගීතය පිළිබඳව ද විචාර සම්පාදනය කර තිබේ.

**වංගීස සුමනසේකර**- 'තීර්ථ කලා පාසලේ' දර්ශනය උගන්වයි. දර්ශනය පිළිබඳව පොදු උනන්දුවක් ඇති කරන්න තවත් පිරිසක් සමග සාමූහිකව විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කරන අතර දර්ශනය සම්බන්ධ කෘති කිහිපයක්ම රචනා කර ඇත. 'බව' බ්ලොග් අඩවියේ සංස්කාරකවරයෙක් ලෙස කටයුතු කරන අතර සමාජ දේශපාලන කරුණු සම්බන්දයෙන් නිරන්තරව අදහස් දක්වන්නෙකි.

**වරදාස් ත්‍යාගරාජා** - කොළඹ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සම්බන්ධතා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති ඇතුළු සමරිසි ප්‍රජාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන තරුණ දේශපාලන ක්‍රියාධාරයෙකු ද වේ. ලංකාවේ සාමය හා ගැටුම් නිරාකරණය මෙන්ම ලිංගික සුළුතරය ගැන ප්‍රාමාණිකයකු වන ඔහු චත්‍ර සමරිසි ජාලය, ප්‍රජා සුහසාධන හා සංවර්ධන අරමුදල, යාල්පාන සංගම්, අනිච්චම් ජාලය මෙන්ම සමාභිමානි සාමුහිකය වැනි ආන්තිකකරණය වු ලිංගික සුළුතර ප්‍රජාව වෙනුවෙන් වැඩ කරන ආයතන හා කණ්ඩායම්වල සම නිර්මාතෘවරයෙකි.

**කෞෂල්‍යා ආරියරත්න** - වෘත්තියෙන් නීතිඥවරියක වන අතර, කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් නීතිවේදී උපාධිය ලබා බ්‍රිතාන්‍යයේ කීල් විශ්ව විද්‍යාලයෙන් මානව හිමිකම් සහ යුක්තිය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමරිසි/සංක්‍රාන්ති සමාජභාවය, මානව හිමිකම්, පශ්චාත් යටත්විජිත සහ නිර්ප්‍රභූ අධ්‍යයන ඇගේ පර්යේෂණ විෂය ක්ෂේත්‍රයන්ට ඇතුළත් වෙයි.

**භූපති නලින් වික්‍රමගේ** - සිනමා හා කළා විචාරකයෙකි. 'දැකල පුරුදු කෙනෙක්' චිත්‍රපටයේ තිර රචකයා වේ. ශ්‍රී ලංකාවේ වත්මන් සංස්කෘතික කතිකාවේ සක්‍රීය භූමිකාවක් ඉටු කරන අතර දෘෂ්‍යකලාව පිළිබඳව විශ්වවිද්‍යාල බාහිර කථිකාචාර්යවරයකු වේ.